# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,741 — 1959 මැයි 8 වැනි සිකුරාදා—8.5.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 1183 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1183 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1184 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 1185 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 1185 |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1186 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1189 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1959 අංක 190**

අංකය : ඩී/වී ඇෆ්ජ්/17/ඒ.

**යුඩ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උප සේවයට මාරුකිරීමක්**

1959 මාර්තු මස 1 වැනි දින සිට, ලංකා ශිෂ්‍ය භට බලකායේ උප සේවයට මාරුකිරීම :—

උප ලෙප්ටිනන්ට් තැන්පත් ටී. ඩී. ජේ. ලූරි, සී. සී. සී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 1.

---

**1959 අංක 191**

අංකය : ඩී/වී ඇෆ්ජ්/16/ඒ.

**යුඩ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

(ඒ) 1959 ජනවාරි මස 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලට කපිතාන්වරුන් වශයෙන්—

ලෙප්ටිනන්ට් තැන්පත් ඕ. ඇල්. ඉසඩීන්, එච්. ජී. ආර්.

ලෙප්ටිනන්ට් තැන්පත් කෝ. ඩී. ඒ. අබයසේකර, ඊ. ඩී., එච්. ජී. ආර්.

ලෙප්ටිනන්ට් තැන්පත් ඊ. ඇම්. ඒ. වීරසිංහ, එච්. ජී. ආර්.

ලෙප්ටිනන්ට් තැන්පත් ඩබ්ලිව්. ටී. ඒ. ඩෙප්, එච්. ජී. ආර්.

(බී) 1959 ජනවාරි මස 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලට කපිතාන්වරුන් වශයෙන්—

උප ලෙප්ටිනන්ට් තැන්පත් ජේ. ද අල්විස්, එච්. ජී. ආර්.

උප ලෙප්ටිනන්ට් තැන්පත් ආර්. වී. කුරේ, එච්. ජී. ආර්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ 1.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 192**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 85/59.

1959 අප්‍රියෙල් මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ජේ. වී. පොන්සේකා මහතා (සී. සී. ඇස්.) මඩකලපුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 86/59.

1959 අප්‍රියෙල් මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. පතිරන මහතා (සී. සී. ඇස්.) කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මැයි මස 5 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 193**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය: ජේඑස්සී. පීපී. 1/59.

එෆ්. සී. පෙරේරා මහතා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගම්පහ, දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේ. එම්. 2/56.

සී. එච්. ද එස්. ගුණවර්ධන මහතා ලංකා අධිකරණ සේවයේ අතිරික්ත නිලධාරියකු වශයෙන් හා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 61/48.

ටී. මුතුසාමිපිල්ලෙයි මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට හා එන්. සිවඥානසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, 1959 අප්‍රේල් 27 වැනි දින පටන් 1959 මැයි 25 වැනි දින දක්වා, යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 1/59.

එස්. සෙල්ලයියා මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට හා අතිරික්ත නිලධාරියකු වශයෙන් හා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 1/59.

එල්. එම්. පී. පී. වීරසිංහ මහතා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ වැඩ බැලීමට කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට (අළුත්කඩේ පිහිටි මහෙස්ත්‍රාත් උසාවියේ).

අංකය: ජේඒ. 1/48.

එල්. එම්. පී. පී. වීරසිංහ මහතා 1959 මැයි 2 වැනි දින, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, අනුරාධපුරයේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,449, 424, 14,954, 16,449, 13,701, 14,818, 16,968 හා 15,198 නඩුවල තීන්දුව දීමට, අනුරාධපුරයේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අනුරාධපුරයේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 1/59.

වී. එස්. ගුණවර්ධන මහතා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, කොළඹ, රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය: ජේඒ. 53/48.

ඩී. එම්. එල්. පින්තු මහතා 1959 අප්‍රේල් 30 වැනි දින, බලන්ගොඩ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 68,245 නඩුවේ තීන්දුව දීමට, රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 71 ඒ/51.

සී. විමලරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩී. සල්ගාදු මහතා 1959 අප්‍රේල් 23 වැනි දින, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 2ඒ/56.

සී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1959 අප්‍රේල් 24 වැනි දින පටන් 29 වැනි දින දක්වා, මඩකලපුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මඩකලපුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 8බී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1959 අප්‍රේල් 27 වැනි දින පටන්, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 42සී/54.

ජී. සී. තයිලස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයනම්බි මහතා 1959 අප්‍රේල් 29 වැනි දින පටන් 1959 මැයි 3 වැනි දින දක්වා හා 6 වැනි දිනද, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ, මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: සී/ජේආර්ඒ. 2/58.

අයි. එච්. හේරත් මහතා 1959 අප්‍රේල් 1 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාත ගම්බද උසාවියේ සභාපති ධුරයට හා කලගම් පළාත ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය: පී.එල්/එම්. 7/56.

එන්. වී. ඊ. මැන්ඩිස් මහතා නැති අතර, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1959 අප්‍රේල් 28 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට හා හිරියාල හත්පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය: පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර ජේ. එස්. පෙරේරා මහතා 1959 අප්‍රේල් 22 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බටහිර පස්දුන් කෝරළේ හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය: පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. අයි. එම්. කලීල් මහතා 1959 අප්‍රේල් 27 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බටහිර පස්දුන් කෝරළේ හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය: පීඑල්/එස්. 10/53.

එම්. සමරක්කොඩි මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඒ. සී. ද සිල්වා මහතා 1959 අප්‍රේල් 24 වැනි දින, 25 වැනි දින හා 27 වැනි දින පටන් කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, සල්පිටි කෝරළේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 අප්‍රේල් 28 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

## වෙනත් පත් කිරීම්

**1959 අංක 194**

අංකය : ඒ.ජේ. 14/5/57.

දිව්රුම් සම්බන්ධ ආඥාපණතේ 12 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් 1959 අප්‍රේල් මස 23 වෙනි දින සිට ඇම්. ඒ. ඇම්. රසීන් මහතා, ගාල්ලේ නාගරික සභාවේ අසරණාධාර සම්බන්ධ නිලධාරි ධුරය දරණ කාලය තුළ ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයෙකු වශයෙන් පත් කර ඇත්තේ ය.

---

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නිවේදනයකින් සංශෝධනය කරන ලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් සහතික කිරීම පිණිස—

යාපනයේ පිස්කල් කායඹාලයේ ලිපිකරු ඒ. සන්මුගරත්නම් මහතා එම ධුරය දරණ කාලය තුළ යාපනය අධිකරණ කොට්ඨාශයට විශේෂ නිලධාරියෙක් වශයෙන් ද,

යාපනයේ පිස්කල් කායඹාලයේ ලිපිකරු බී. විල්fප්‍රඩ් මහතා එම ධුරය දරණ කාලය තුළ යාපනය අධිකරණ කොට්ඨාශයට විශේෂ නිලධාරියෙක් වශයෙන් ද,

කුරුණෑගල පිස්කල් කායඹාලයේ ලිපිකරු වී. සුබ්‍රමනියම් මහතා 1959 අප්‍රෙල් මස 27 වෙනි දින සිට දන්ඩගමුවේ කනදුල්ලේ පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලය තුළ දන්ඩගමුව කනදුල්ල අධිකරණ කොට්ඨාශයට විශෙෂ නිලධාරියෙක් වශයෙන් ද,

පත් කර ඇත්තේ ය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 අප්‍රේල් මස 21 වෙනි දින සිට, ආර්. බී. රණතුංග මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. කන්දසියා මහතාද,

1959 අප්‍රේල් මස 21 වෙනි දින සිට, ඩී. ඒ. එස්. අලගියවන්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ උඩුගහපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩී. එස්. මීගල්ල මහතාද,

1959 අප්‍රේල් මස 22 වෙනි දින සිට, කේ. ඩබ්ලිව්. තිමොතියස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල්ල කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජී. පී. එච්. ද සිල්වා මහතා ද,

1959 අප්‍රේල් මස 22 වෙනි දින සිට, පී. බී. රත්නායක මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ උඩපළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. බී. දෙළුන්ගහවත්ත මහතාද,

1959 අප්‍රේල් මස 22 වෙනි දින සිට, එම්. මුරුගේසු මහතා නැවත වැඩ බාරගන්නා තුරු, යාපනේ දිස්ත්‍රික්කයේ කොඩෙච් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට වී. කාතිගේසු මහතාද,

1959 අප්‍රේල් මස 23 වෙනි දින සිට, එස්. එම්. තියොපිලස් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනෙයි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. සෝමසුන්දරම් මහතාද,

1959 අප්‍රේල් මස 24 වෙනි දින සිට, එස්. එම්. සවන්තු මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ නැගෙනහිර නානාන්දන් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එම්. එම්. කාසිම් මහතාද,

1959 අප්‍රේල් මස 28 වෙනි දින සිට, ආර්. සින්නම්පරපිල්ලෙයි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ දකුණු මන්මුනෙයි සහ ඉරුවිල් පොරතිව් පත්තුවල ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩ බලන කාලය තුළ එම පත්තුවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. පෙරුමසිනාර් මහතා ද,

පත් කර ඇත්තේ ය.

ජී. සී. පී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1959 මැයි මස 5 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

**1959 අංක 195**

වික්ටර් ජෙරෝම් වීරක්කොඩි මහතා කොළඹ අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹදීය.

---

**1959 අංක 196**

ඉනයතුල්ලා අහමඩ් සහිඩ් මහතා ගාලු අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹදීය.

---

**1959 අංක 197**

සේවාරත්න යාපා බණ්ඩාර මුදියන්සලාගේ පුංචි බණ්ඩාර හේරත් මහතා කුරුණෑගල අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹදීය.

---

**1959 අංක 198**

මොහමඩ්ලෙබ්බේ සලාහුදීන් මහතා බදුල්ල අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹදීය.

---

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

**1959 අංක 199**

මෙහි සඳහන් පත්කිරීම් ම විසින් නියම කර ඇත :—

1. සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන මහබදුගේ මෙරිල් සිරිපාල ප්‍රනාන්දු ජයසූරිය මහතා 1959. 3. 15 දින සිට බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.
2. සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන පුන්චි බණ්ඩා රණවීර මහතා 1959. 3. 25 වැනි දින සිට මහනුවර පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

3. සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන දැපුර සිසිලින් ද සිල්වා මහතා 1959. 4. 1 වැනි දින සිට මීගමුවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයයෙහි සේවය කරමින් කොළඹ පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

4. සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන වීරසූරිය මුදියන්සෙලාගේ ජයසිරි වීරසූරිය මහතා 1959. 4. 10 වැනි දින සිට අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

5. සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වන ඩේවිඩ් හේරත් තෙලිසිංහ මහතා 1959. 4. 22 වැනි දින සිට හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයයෙහි සේවය කරමින් පුත්තලම්-හලාවත පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

පී. ඊ. ගුණරත්න,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1959 මැයි මස 4 වැනි දින,
කොළඹ 1, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදීය.

---

## ආණ්ඩුවේ නිවේදන

### අළුත් ආදායම් මුද්දර නිකුත් කිරීම

**රුපි. 20, රුපි. 50, රුපි. 100, රුපි. 500 සහ රුපි. 1,000**

**වටිනාකම් සඳහා**

රුපියල් විස්ස, රුපියල් පණහ, රුපියල් සියය, රුපියල් පන්සියය සහ රුපියල් දහ යන වටිනාකම් ඇති ලංකා රාජ්‍ය චිහ්නය දරණ නව ආදායම් මුද්දර 1959 ජූනි මස 1 වෙනි දින සිට විකිණීම පිණිස නිකුත් කරන බව මහා ජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ මුද්දර වල—

(අ) "Revenue" යන ඉංග්‍රීසි වචනය වෙනුවට "ආදායම්" යන සිංහල වචනය යොදනු ලැබේ ;

(ආ) වටිනාකම වචනවලින් සිංහලෙන් සඳහන් කොට, එය යළි සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන තෙබසින්, ඉලක්කමින් දක් වේ ;

(ඉ) "ලංකාව" යනු සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන තෙබසින් ම සඳහන් වේ.

රුපියල් විස්ස, රුපියල් පණහ, රුපියල් සියය, රුපියල් පන්සියය, රුපියල් දහ යන වටිනාකම් ඇති දැනට පාවිච්චි කරනු ලබන මුද්දර විකිණීම 1959 ජූනි මස 1 වෙනි දින සිට නවත්වනු ලැබේ. එහෙත් එදට කලින් මිලයට ගනු ලැබූ එම ශ්‍රේණිවල කවර මුද්දරයක් හෝ එදිනෙන් පසුව ද පාවිච්චි කළ හැකිය.

ස්ටැන්ලි ද සොයිසා,
මුදල් ඇමති.

1959 මැයි මස 6 වැනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

---

### 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

**ආඥාව**

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය මානික්කු වඩුමේස්ත්‍රී හෙන්ද්‍රික් සිල්වා වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ 'බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුව) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි අළුත්ගම ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කරමි :—

(1) කලගෙඩිහේන පදිංචි පරාක්‍රම ප්‍රසන්න සිරිවර්ධන.

(2) තිහාරිය පදිංචි අබ්දුල් රහුමන් මොහමඩ් ජුනයිඩ්.

(3) කලගෙඩිහේන පදිංචි එදිරිසූරිය මුදලිගේ විලී පීටර් එදිරිසූරිය සිරිවර්ධන.

(4) අළුත්ගම පදිංචි දෙන් ඇල්බට් ෆ්‍රැන්සිස් කුමාරසිංහ.

(5) තිහාරිය පදිංචි පළවෙනි ආරච්චිගේ සිමියොන් පෙරේරා.

(6) අළුත්ගම පදිංචි කරුණානායක ජයවර්ධන අප්පුහාමිලාගේ විලියම් සිංඤෝ.

(7) කරනායකමුල්ල පදිංචි ආරියසිංහ විමලසේන.

(8) කෙහෙල්වතුගොඩ පදිංචි වීරසිංහ ආරච්චිගේ දෙන් ජේමිස් වීරසිංහ.

(9) නිත්තලපිටිගොඩ පදිංචි නිත්තලපිටිගේ හරිස්චන්ද්‍ර කරුණාතිලක.

(10) අළුත්ගම බෝගමුව පදිංචි කුරුප්පු අප්පුහාමිලාගේ දෙන් ඒබ්‍රහම් අප්පුහාමි කුරුප්පු.

(11) අළුත්ගම පදිංචි ජයසුන්දර හේවගේ පවුලිස් පීටර් ද්‍රබෙරේ.

(12) යක්කල පදිංචි කුස්තන් ආරච්චිගේ ඩේවිඩ් පෙරේරා.

(13) කොස්කඳවල පදිංචි රණසිංහ හෙට්ටි ආරච්චිගේ බුජවංශ රණසිංහ.

(14) වීරගුල පදිංචි ආරච්චි අප්පුහාමිලාගේ දෙන් කරුණාසේකර.

(15) අල්ලෙ තුත්තිරිපිටිය පදිංචි රණසිංහ හෙට්ටි ආරච්චිගේ දෙන් උදේනිස් රණසිංහ.

(16) ඕගොඩපොල පදිංචි සමරනායක රාජපක්ෂ මුදලිගේ පීටර් සිංඤෝ.

(17) මීවල පදිංචි ජයකොඩි ආරච්චිගේ දෙන් ලෙයාරිස් ජයකොඩි.

(18) තිහාරිය පදිංචි අබ්දුල් අසීස් මහමූඩ්.

(19) කලෝටුවාව පදිංචි ජයසේකර සුබසිංහ ආරච්චිගේ දෙන් ලුවිස් ජයසේකර.

(20) කටුවස්ගොඩ පදිංචි මාරසිංහ රත්නායකගේ ලයනල් කරුණාරත්න.

(ආ) ඉහත කී මණ්ඩලයේ සභාපති වශයෙන් කල්ගෙඩිහේන පදිංචි පරාක්‍රම ප්‍රසන්න සිරිවර්ධන මහතා පත් කරමි ; තවද

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2ක් විය යුතු යයි නිශ්චය කරමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ ඇමති.

1959 මැයි මස 5 වෙනි දින,
කොළඹදීය.

---

ඇල්. ඩී.—බී. 59/58.

### 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

**3 (2) වෙනි වගන්තිය යටතේ කරන ලද දැන්වීමයි**

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත්, මානික්කු වඩුමේස්ත්‍රී හෙන්ද්‍රික් ද සිල්වා වන මම, මෙහි ඇති උප ලේඛනයේ සඳහන් එක් එක් ගම් ප්‍රදේශයක් සඳහා සමගිදායකයින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාවද, ඒ ගම් ප්‍රදේශයේ සෑම ග්‍රාම සංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජා මණ්ඩලයක් ද, සමූපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ඒ ගම් ප්‍රදේශයේ සෑම සමූපකාර සමිතියක් ද විසින් නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන් 1959 ජූනි 1 වෙනි දින හෝ ඊට පළමු මා වෙත නිර්දේශ කළ හැකි බව මෙයින් දන්වමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ ඇමති.

1959, මැයි මස 2 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදිය.

#### උපලේඛනය

1. රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උඩ පත්තු කුරුවිටි කෝරලේ ගම් ප්‍රදේශය.

2. රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උඩපත්තු නවදුන් කෝරලේ ගම් ප්‍රදේශය.

3. නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි දියතිලක ගම් ප්‍රදේශය.

4. නුවර එළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ඔය පලාත ගම් ප්‍රදේශය.

5. පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කම්මල් පත්තු ගම් ප්‍රදේශය.

6. පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි යගම් පත්තු ගම් ප්‍රදේශය.

7. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම්පලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි නැගෙනහිර කඩවත් කෝරලේ ගම් ප්‍රදේශය.

8. අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර නුවරගම් පලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි විලච්චිය කෝරලේ ගම් ප්‍රදේශය.

9. බදුලු දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි කළුකර ගම් ප්‍රදේශය.

10. බදුලු දිස්ත්‍රික්කයේ වියලුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි සොරනාතොට ගම් ප්‍රදේශය.

11. පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි පොලොන්නරුව ගම් ප්‍රදේශය.

12. පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි ඇලහැර ගම් ප්‍රදේශය. ...

## දැන්වීමයි

අංක 9,773 සහ 1947. 9. 24 දින දරණ විශේෂ ගැසට් පත්‍රයේ පලකරණලද 1947. 9. 18 දින දරණ නිවේදනයෙන් සංශෝධනය කරණලද (91 වෙනි පරිච්ඡේදයේ) නොතාරිස්වරුන් පිළිබඳ ආඥා පනතේ 19 වෙනි වගන්තිය යටතේ ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙක්වූ ලොකු බන්ඩා කොලුගල මහතාගේ නොතාරිස් බලපත්‍රය 1959 අප්‍රේල් මස 21 වැනි දින අවලංගු කරනලදී.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 21 වෙනි දින,
කොළඹදීය.

---

# 4 ඒ පෝරමය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩ බලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මං, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම්, කුමන කාරණා නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිඬ කළ දින සිට මාසයක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුඬවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුඬවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස් තැන.

1959ක්වූ මැයි මස 5 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| K 11602/J—5.8.51 | .. | නේරුප්සයිබු පාකීර් මොහිඩීන් අබ්දුල් වහාබ්, ෂෙල් fපිලින් ෂ්වේෂම, මස්කෙළිය |
| P 8553/J—3.4.51 | .. | නදුනායගම් රාමජෙයම්, ඇල්ටන් වත්ත, අප්කොට් |
| P 4980—30.11.50 | .. | රාමයියා මාරිමුත්තු නොහොත් අම්මාසි, ඩේවන් වත්ත, තලවකැලේ |
| R 5121—22.7.51 | .. | වීරප්පන්ගේ වැන්දඹුව වූ සුරුම්බායි, උඩ රදැල්ල වත්ත, නානුඔය |

---

# 4 බී පෝරමය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මං, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලේඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුණි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුලත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස් තැන.

1959 මැයි මස 5 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමඟ ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| F 5245—22.7.51 | .. | ඇන්. මුරුගන් පලනි නොහොත් පලනිසාමි, 157, දෙල්තොට පාර, ගලහ | පූමාලෙයි (භාර්යාව), සිවපෙරුගාසම් නොහොත් විමලනාදන් (පුතා), රාමනාදන් (පුතා), සිවගාමි නොහොත් ජෙගතාම්බාල් (දුව), කයිලෙයිනාදන් (පුතා), සච්චිතානන්දම් (පුතා) |
| L 1822/F—8.2.51 | .. | වඩිවේල් රාජමනි නොහොත් සිගමනි, ලෙව්චුම් වත්ත, ගලහ | යෝග සාලාච්චි (භාර්යාව), කනපති (පුතා), රාසයියා නොහොත් රාජරත්නම් (පුතා), තවමනි (දුව), සෙල්ලදුරෙයි (පුතා), තියාගරාජ් නොහොත් ගෝවින්දරාජ් (පුතා), සෙල්වම් (දුව), පුවනේස්වරි (දුව), කුමාරවේල් (පුතා), පුරනවති (දුව) |
| L 8476/F—11.6.51 | .. | වීරසාමි ඔන්ඩිමුත්තු නොහොත් වැන්දඹුවවූ අයිලාන්දම්, අළුත් නිළඹෙ කොටස, නිළඹෙ වත්ත, ගලහ | මරුදෙයිගේ කාදන් නොහොත් රාජගෝපාල් (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියා පදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| H 4530—11.6.51 .. | සෙල්ලම්බරම් පිල්ලෙයි මුත්තුසාමි පිල්ලෙයි, ගොඩමඩිත්ත වත්ත, කැන්ගල්ල | අගිලාන්දම්මාල් (භාර්යාව), කාමාච්චිඅම්මාල් (දුව), සෙල්ලම්මාල් (දුව), උමාපති නොහොත් උමාදේවි (දුව), සරෝජිනි (දුව) |
| P 4437—18.11.50 .. | රාමසාමි සෙල්ලමුත්තු, පහළ කොටස, දිඹුල වත්ත, කොටගල | කාතායි (භාර්යාව), සෙල්වමනි (දුව), තනිලෙච්චුමි (දුව), නාමනාදන් (පුතා) |
| P 4860—9.12.50 .. | මුත්තුසාමි පෙරියන්නන්, ස්ටෝනික්ලිෆ් වතුයාය, කොටගල | පෙරියම්මාල් (භාර්යාව), තවමනි (දුව) |
| P 5071—30.11.50 .. | පූච්චි වීරප්පන්, ඩේවන් වත්ත, තලවකැලේ ... | ලෙච්චුමි (භාර්යාව), සාක්කම්මාල් (දුව), සුබ්‍රමානියම් නොහොත් වීරපාන්ඩියන් (පුතා), වීරයියා (පුතා), සෙල්වරාජ් (පුතා) අන්තපාකියම් (දුව) |
| P 5101—30.11.50 .. | අසන් මාදර්සා, ඩේවන් වත්ත, තලවකැලේ ... | කාදර් අම්මා (භාර්යාව), මුසලිඅම්මා (දුව) |
| P 5134—30.11.50 .. | ආරෝකියම් රායප්පන්, ඩේවන් වත්ත, තලවකැලේ | තයිලි (භාර්යාව), අන්තෝනිමුත්තු (පුතා) |
| P 5159—30.11.50 .. | මුනියන්ඩි ආදර්මලෙයි, ඩේවන් වත්ත, තලවකැලේ | සිවනම්මාල් (භාර්යාව), අන්තෝමනි නොහොත් අන්තෝනිඅම්මාල් (දුව) |
| P 5832—10.2.51 .. | කාරන් අලගන් කන්දයියා, වයිදන්සයිඩ් වත්ත, කොටගල | කාලිඅම්මා (භාර්යාව), මේරි නොහොත් රෝස්රී (දුව) |
| P 6504—23.2.51 .. | නාත්ඩවන් වීරමුත්තු, ක්‍රිස්ලර්ස්ෆාම් වත්ත, කොටගල | නල්ලම්මාල් (භාර්යාව), පිච්චයිපිල්ලෙයි නොහොත් නාත්ඩායි (දුව), කුප්පායි (දුව) |
| P 8917—27.5.51 .. | රාමසාමි වේළු, වයිදන්සයිඩ් වත්ත, කොටගල ... | මූක්කායි (භාර්යාව), කන්දවේළු නොහොත් තන්ගවේළු (පුතා), ලෙච්චුමි (දුව), මාරියායි (දුව), සින්නාමනි (දුව), ජානගී (දුව), කිට්නසාමි (පුතා) |
| P 7803—19.3.51 .. | රඟුදුම්බන් මරුදෙයි, රොසිටා වත්ත, කොටගල ... | ලෙච්චුමි (භාර්යාව), රාසම්මා (දුව), කමලම් (දුව) |
| K4501/J—14.4.51 .. | නාරායනන් කරුප්පයියා, කින්කෝරා කොටස, ඇල්ටන් වතුයාය, අප්කොට් | වීරම්මාල් (භාර්යාව), තිල්ලෙයිඅම්මාල් (දුව), ෂන්මුගම් (පුතා), රාසලෙච්චුමි (දුව), සාර්නාම්බාල් (දුව) සාරසු නොහොත් සරස්වති (දුව), සිවලිංගම් (පුතා), කන්නසන් (පුතා), සතාසිවම් (පුතා) |
| K 5848/J—24.5.51 .. | මරුදෙයි කන්දන්, ඇල්. ඩී. කේ. කොටස, වෙලේඔයවත්ත, හැටන් | රෙන්ගම්මා (භාර්යාව), මරුදායි (දුව), සන්නාසි, (පුතා), සෙවනු (පුතා), තන්ගයියා නොහොත් තන්ගවේල් (පුතා), කනවති (පුතා), මාරියායි (දුව), ආරුමුගම් නොහොත් කන්දසාමි (පුතා), සින්නපිල්ලෙයි (දුව) |
| K 6175/J—31.5.51 .. | රාමසාමි සුබ්‍රමානියම්, පහළ කොටස, වෙලේඔයවත්ත, හැටන් | සෙල්ලම්මා (භාර්යාව), තිරුමාලේ නොහොත් මුත්තුසාමි (පුතා), රාමායි (දුව), අරුනාසලම් (පුතා), පෙරුමාල් නොහොත් ගෝවින්දන් (පුතා), ආරායි (දුව), මාරියායි නොහොත් වීරම්මා (දුව), රාසලෙච්චුමි නොහොත් ආදිලෙච්චුමි (දුව), වෙල්ලන් (පුතා), පාර්වතී (දුව), පොන්ගම්මා (දුව) |
| K 6202/J—31.5.51 .. | ආන්ඩි මුනියන්, වෙලේඔය වත්ත, හැටන් | කන්නි (භාර්යාව), ආන්ඩි (පුතා), ලෙච්චුමි (දුව), සරස්වතී (දුව) |
| K 6584/J—31.5.51 .. | පෙරුමාල් බාලකිරුෂ්නන්, වෙලේඔය වත්ත, හැටන් | මරුදායි (භාර්යාව), ආදිලෙච්චිමි (දුව), කිට්නසාමි නොහොත් ගෝවින්දසාමි (පුතා), රාජේන්දර නොහොත් තියාගරාජා (පුතා), තෙයිමානේ (දුව) |
| K 6624/J—31.5.51 .. | අරුලප්පන් මයිකල්, ඉහළ කොටස, වෙලේඔය වත්ත, හැටන් | මයිකල්අම්මාල් (භාර්යාව), අන්නම්මාල් නොහොත් අන්නමරියා (දුව), යාගුලම් නොහොත් යාලම්මා (දුව), සිල්වෙස්ටර් නොහොත් සිලුවායි (පුතා), ඉරුදයම් නොහොත් ආරෝකියම් (දුව), සිසලි (දුව), මසිලමනි (පුතා) |
| J 4000—18.6.51 .. | ඉරුසන් අන්නමලෙයි, බතියන් වත්ත, මස්කෙළිය | සින්නම්මා (භාර්යාව), සිවපාකියම් (දුව), සුබ්‍රමානියම් (පුතා), පුෂ්පා (දුව), බාලක්‍රිෂ්නන් (පුතා), කරුප්පයියා (පුතා) |
| J 4087—18.6.51 .. | මුත්තුසාමි වේලයුදම්, බතියන් වත්ත, මස්කෙළිය ... | සෙල්ලම්මා (භාර්යාව), තන්ගරාජු (පුතා) |
| J 4389—15.7.51 .. | සෙන්ගන් කිට්නන්, ලඩකා කොටස, ග්ලෙන්ටිල්ට් වතුයාය, මස්කෙළිය | මක්ජායි (භාර්යාව), වීරම්මා (දුව), රාමලිංගම් නොහොත් රාමජේයම් (පුතා) |
| J 4544—24.6.51 .. | සන්දනම් සන්තියාගු, ඩීසයිඩ් වත්ත, මස්කෙළිය ... | ජේබමාලෙයිමේරි (භාර්යාව), මරිඅම්මා (දුව), සින්නප්පන් නොහොත් සාන්තප්පන් (පුතා), රෝස්මේරි (දුව), අරුල්දාස් නොහොත් අරුලප්පන් (පුතා), සෝවන් නොහොත් ප්‍රනාන්දු (පුතා), පිලෝමිනම්මා (දුව) |
| J 4626—26.7.51 .. | අරුනාසලම් සිදම්බරම්, අංක 2, ලුකොම්බ් බසාර්, මස්කෙළිය | සිවපාකියම් (භාර්යාව), රාජකුමාර් (පුතා) |
| K 6642/J—31.5.51 .. | මුත්තු රාමසාමි, වෙලේඔයවත්ත, හැටන් | සින්නම්මාල් (භාර්යාව) |
| K 6644/J—31.5.51 .. | සින්නතම්බි සොක්කලිංගම්, වෙලේඔයවත්ත, හැටන් | මීනාල් නොහොත් මීනාච්චි (භාර්යාව), පාර්වතී (දුව), සෙවනු නොහොත් සිවසාමි (පුතා) |
| K 13474/J—4.8.51 .. | වෙල්ලසාමි ලක්නන්, යුලිපිල්ඩ් වතුයාය, හැටන් ... | පොන්නම්මා (භාර්යාව), දෙරෙයිරාජ් (පුතා), විජේයලෙච්චුමි (දුව), ගෝමතිඅම්මාල් (දුව), ගෝවින්දරාජා (පුතා), පුෂ්පන් නොහොත් පුෂ්පාවතී (දුව) |
| N 3565/J—2.1.51 .. | කොලන්දෙයි වේලයුදම්, මස්කෙළිය වත්ත, මස්කෙළිය | සින්නම්මා (භාර්යාව), සෙලම්බායි නොහොත් පලනිඅම්මා (දුව), පුවනේස්වරි (දුව), කමලම් (දුව) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1952කේ ආහාර පාලන අණපනත් යටතේ දැන්වීමයි

1952කේ ආහාර පාලන අණපනත් වල III වැනි කොටසේ (ඊ) අක්ෂරය දරණ ශීර්ෂය යටතේ, 4 (3) දරණ පනත අනුව මහජනයා වෙත මෙයින් දන්වා සිටිනුයේ, 19 වැනි වාරයේ හාල් සීට්ටු පොත් 1959 මැයි 18 වැනි සඳුදා වලංගු වන බවයි. 19 වැනි වාරයේ නොම්මර 1 දරණ කූපනය, 1959 මැයි 18 වැනිදාසිත් පටන් ගන්නා සතිය තුළදී ද, නොම්මර 2 දරණ කූපනය 1959 මැයි 25 වැනි දාසින් පටන් ගන්නා සතිය තුළදී ද යන ක්‍රමයට කූපන් වලංගු වෙනවා ඇත.

ධර්මසේන ජයනෙත්ති,
ආහාර පාලක.

1959 මැයි 5 වැනි දින,
කොළඹ දීය.

## දැන්වීමයි

වර්‍ෂ 1942කේ අංක 31 දරණ ලංකා ජාතික කෞතුකාගාර ව්‍යවස්ථාවේ 9 වැනි ඡේදය යටතේ පැනවූ රීති අතුරෙන් වර්‍ෂ 1948ක්වූ අප්‍රේල් මස 30 වැනි දින නිකුත් කරන ලද අංක 9,859 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඞ කරන ලද, සංශොධිත 3 වැනි රීතිය අනුව කොළඹ, මහනුවර, යාපනේ සහ රත්නපුර පිහිටා ඇති ජාතික කෞතුකාගාර 1959ක්වූ මැයි මස 21 වැනි බ්‍රහස්පතින්ද වෙසක් පුර පසළොස්වක නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් දන්වනු ලැබේ.

පි. ඊ. පි. දැරණියගල,
ලංකා ජාතික කෞතුකාගාර අධ්‍යක්‍ෂ.

1959 මැයි මස 5 වන දින,
කොළඹ දීය.

---

## විශෙෂ නිවේදනයයි

1959 මැයි මස 21 සහ 22 වැනි දිනයන් ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, ගැසට් පත්‍රය, 1959 මැයි 20 වැනි බදාදා නිකුත් කරන හෙයින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මැයි මස 16 වැනි සෙනසුරාදා දහවල් 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මැයි 6 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1** වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කායඹාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායඹාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කායඹාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.